# නිවන තෙක් සැප විපාක ගෙන දෙන පහන් පූජාව

## පඤ්චදීපකත්ථෙරාපදානය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, ඛුද්දක නිකාය, අපදානපාළි 1 - පිටු අංක 190 - 191)

පදුමුත්තර බුදු රජාණන් වහන්සේගේ ධර්මයෙහි මනා ව හැසිරුණු අයෙක් පැහැදුනු සිතින් බෝධියක් වට කොට පහන් පූජාවක් කළා. ඒ ආත්ම භාවයේ සිට ගෞතම බුදු සසුනේ සියලු කෙලෙසුන් නසා රහත් බව ලබන තුරු ඔහු ඉපදුනේ දිව්‍ය හා මනුෂ්‍ය ලෝකවල පමණයි. මහා පර්වත, බිත්ති ඉක්මවා යොදුන් සියයක් දැකීමට ඔහුට හැකියාව ලැබුණා. සක්විති රජ පදවි දැරුවා.